KASHAYA SANGRAHA

(A Collection of Prescriptions.)

BY

Godamune Sri Dewamitta Maha Thero.

Published by

B. A. D. Manoris Appuhamy.

Printed at the

Wijaya press Ambalangoda.

කෂාය සංග්‍රහය.

ගොඩාමුණේ ශ්‍රී දේවමිත්තාභිධාන

මහා ස්වාමිපාදයාණන් වහන්සේ විසින්

සංග්‍රහ කරණලදී.

බී. ඒ. ඩී. මනෝරිස් අප්පුහාමි

විසින්

අච්චුගස්වා ප්‍රසිද්ධ කරණලදී.

අම්බලංගොඩ "විජය" යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

2471
1927

කෂාය සඞ්ග්‍රහය.

ගොඩාමුණේ ශ්‍රී දෙවමිත්තාභිධාන

මහා ස්වාමිපාදයානන් වහන්සේ විසින්

සඞ්ග්‍රහ කරණලදී.

බී. ඒ. ඩී. මනෝරිස් අප්පුහාමි

විසින්

අච්චුගස්වා ප්‍රසිද්ධ කරණලදී.

අම්බලම්ගොඩ

"විජය" යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

2471

1927

සංඥාපනය.

ශ්‍රී ලඞ්කාද්වීපයෙහි ආදිභාගයෙහි සිට උද්දීප්තව පැතිරී ගිය සිංහල වෛද්‍යශාස්ත්‍රය අභාවප්‍රාප්ත වනු දැක්ම සිංහලවූ කවුරුන් හටත් ඛේදජනක වියයුතුයි. යම් ජාතියක පරම්පරාගතව පැවත එන ශාස්ත්‍රමාර්ගාදියක් පරිහාණිමුඛයට පැමිණේනම් හෙද එකී ජාතියෙහි වැඩිදියුණුව පිළිබඳ මාර්ගාවරණයක් වේ.

දැනට බටහිර සිරිත් විරිත් උසස්කොට පිළිගත් ඇතැම් සිංහල ජනයා අපේ සිංහල වෛද්‍ය ශාස්ත්‍රය පහත්කොට සැලකීමකුදු පැනේ. අවුරුදු දෙදහස් ගණනකින් ඔබ්බෙහිදී සිට හෙළදිව් වැසියන්ගේ ජීවිත සෞඛ්‍යසංරක්ෂණය සලස්වා දුන් අලාමක ප්‍රඥාවත් අප පැරණියන් විසින් පරිශීලනය කරනලැබූ ප්‍රත්විත තැණවත් ලෝකයා පවා වර්ණනා මුඛයෙන් උසස්කොට පිළිගත් ඒ මේ ආයුර්වේදීය සිංහල වෛද්‍යශාස්ත්‍රය ගැන එසේ සැලකීම ජාතිකවාත්සල්‍යයන්ගේ යුතුකමකැයි නොහැඟේ. එම සිංහලවෛද්‍යශාස්ත්‍රයගේ පරිහානියට විශෙෂහෙතුව වූයේ සිංහල මහීපාලයන්ගෙන්පසු රාජකීය සම්බන්ධතාවයක් මේ නොබෝද වනතුරු නොමැති වීමයි. මෙසේ පවත්නා අතර ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ දැනටසිටින ගරු මහජන මන්ත්‍රීවරයන්ගේ දෘඪෝත්සාහය නිසා මෙළගදී සිංහල වෛද්‍ය ශාස්ත්‍රයට ලඞ්කාණ්ඩුව විසින්ද ධෛර්‍යදීමට බැඳීම මෙම ශාස්ත්‍රයේ අගය දත් සියල්ලන්ගේ අමන්දානන්දයට හෙතු වියයුතුයි.

ආයුර්වේද විද්‍යාර්ණව පාරප්‍රාප්ත සාරාර්ථ සංග්‍රහ කර්තෘභූත ශ්‍රීමත් බුද්ධදාසාදි සිංහල මහා මහීශ්වරයන් පමණක් නොව සිංහල යෝගරත්නාකර, භෛෂජ්‍යමඤ්ජූෂා යන වෛද්‍යග්‍රන්ථයන් නිපදවූ මෝරගම්මන මහාස්ථවිර පාදය පස්මුල මහා ස්වාමිපාදය එකී භෛෂජ්‍ය මඤ්ජූෂාවට පදාර්ථ වර්ණනායකර වදාළ බුද්ධාඞ්කුරශ්‍රීන් විරාජිත වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සඞ්ඝරාජ මහාස්ථවිර ස්වාමිපාදය යනාදි ප්‍රා[illegible]න ශාස්ත්‍ර මාමක ප්‍රතිපත්ති ගරුක මහා ස්ථවිරයන් වහන්සේලාද සිංහල වෛද්‍ය ශාස්ත්‍රාභිවෘද්ධියෙහි ලා නොපසුබට වීමෙන් ලෝවැඩ වැඩූහ යනු වෙසෙසින් සැළකුව මනායි.

මෙසේහෙයින් ජාත්‍යාභිවර්ධනයෙහිලා පරාජයටද අදාළවූ සිංහල වෛද්‍යශාස්ත්‍රය ගැන පිටුවහල්වනු මැනවයි අප දූත ඇඳිනගත් කිහිපදෙනකුන් විසින් අප වෙත ආයාචනා කරන ලදුව කරුණා පූර්වක තදාරාධනය ඉවසීමෙන් බෙම්මතොට බෝධිමාලක රජමහා විහාරාධිපති ගෞරවාර්හ ගොඩමුණේ සෝනුත්තරාභිධාන මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූද විබුධ ජන ශේඛරායමාන කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩවිසූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන ප්‍රධාන නායක මාහිමියාණන් වහන්සේගේ ධර්මාන්තෙවාසිවූද අප විසින් මෙම **කෂායසංග්‍රහ ග්‍රන්ථ** සම්පාදනයෙහි මීට දශවර්ෂයකින් මත්තෙහි ව්‍යාපෘතවූ නමුත් අප නිවැසි බෙම්මතොට වලල්ලාවිටි කෝරළයේ ගොඩමුණේ ශ්‍රී දෙවප්‍රියාරාම විහාරස්ථානයෙහි අභිනව බුද්ධ ප්‍රතිමාලය, සඞ්ඝාවාසාදි නවකර්මාන්ත කරවීමෙහි හා ප්‍රදෙශාභිවෘද්ධිය, ශිෂ්ටාචාර සංරක්ෂණය, ආගම වාත්සල්‍යය යනාදියෙහි තත් ප්‍රදෙශස්ථ ජනව්‍යාපාරිත විසින් කාලොචිත අවවාදනුශාසනා දීමෙහිද, ශිෂ්‍යයන්ට ඉගැන්වීමෙහිද, නිරතවීම හෙතුකොටගෙන සමාරබ්ධ ග්‍රන්ථ සම්පාදන කාර්‍ය්‍යය පිළිබඳව මෙතරම් කලක් ගතවෙන්ට සිදුණා ඇත.

කෂාය සංග්‍රහය, විධිවූ පරිද්දෙන් ද්‍රව්‍ය සමූපෙතකොට පාදාවශෙෂ අර්ධාවශෙෂ ත්‍රිපාදාවශෙෂ වශයෙන් පැසවනලද පැන කෂාය නම්. වෙන් වෙන් වශයෙන් පැතුරුණවුන්ගේ එකතැන රැස්කොට ලීම සංග්‍රහයයි. ඒකෂායයන්ගේ සංග්‍රහය කෂායසංග්‍රහයවේ. කෂායාඛ්‍යාත යොග (ශෙලාකාදීන්) සඞ්ගෘහීත ග්‍රන්ථයද උපචාර විසින් කෂාය සංග්‍රහ නම්. එසේ කල්හි අවිශෙෂයෙන් කෂායන්ගේ සංග්‍රහය පැණෙතුදු සප්තවිධ කෂායයන් අතුරෙන් අෂ්ටභාගාවශෙෂිතය පමණක් මෙහිලා සඞ්ගෘහීතබැව් සැළකියයුතුයි.

තවද චරකය, සුශ්‍රුතය, වාග්භටය, හාරීතය, භාවප්‍රකාශය, යොගරත්නාවලිය, සාරචන්ද්‍රිකාය, යොගතරඞ්ගිනිය, භෛෂජ්‍යරත්නාවලිය, වෛද්‍යකල්පද්‍රුමය, වෛද්‍යශබ්දසින්ධුවය, චක්‍රදත්තය, ශ්‍රී යොගරත්නාකරය, ශාර්ඞ්ගධරය, චිකිත්සාක්‍රමකල්පවල්ලිය, රසරත්නාකරය, වෛද්‍යවිනොදනිය, සාරභෛෂජ්‍යප්‍රදීපය, චිකිත්සා සාරය. රසෙන්ද්‍රසංග්‍රහය, යොගසාරය, වෛද්‍යමුක්තායයනාදී විදෙශීයග්‍රන්ථයන්ගෙන්ද, එසේම දූනට සිංහලාක්ෂරයන්ගෙන් මුද්‍රිතවතිබෙන වෛද්‍ය ග්‍රන්ථයන්ගෙන්ද, පෞරාණික බොහෝ බෙහෙත් වට්ටෝරුවලින්ද, අෂ්ටාවශෙෂිත කෂාය උපුටා ඒ ඒ චිකිත්සානුගත පරිද්දෙන් සංග්‍රහ කරලිමු.

යථොක්ත ඒසා මහත් ග්‍රන්‍ථ මාලාවක් පරිශීලනය කිරීමෙන් උගතයුතුවූ මේ කෂාය සමූහය එකම ග්‍රන්‍ථයකින් දැනගන්ට ලැබීම වෛද්‍ය ශාස්ත්‍රාභිලාශීන්ගේ අමන්ද ප්‍රබොධයට හෙතුවියයුතුයි. මෙසේහෙයින් මේ කෂායසංග්‍රහය, සර්‍වසංහාර ඖෂධයෙක්ය. නිරවද්‍ය වෛද්‍යවිද්‍යාමන්දිරයෙක්ය. ග්‍රන්‍ථභාණ්ඩාගාරයෙක්යයි ගිණිය යුතුවේ. එකම පොතක් හැදෑරීමෙන් අෂ්ටමාංශාවශෙෂිත කෂාය දෙදහස් ගණනක් පමණ දැනගැණීමට ඉඩහල්වූ අන්‍ය සංග්‍රහයක් ස්වදෙශයෙහි තබා විදෙශයෙහිවත් පවත්නාබවක් මෙතුවක් අපට දැනගන්නට නොලැබුණේය. කතීතව්‍යයෙහි ලා ලාඝව පැවැත්ම සවොතකාමීයෙන් පිළිගැනෙන හෙයින් වෛද්‍යශාස්ත්‍රාද්ග්‍රහණයෙහි නියලියන්හට මේග්‍රන්‍ථය ඉදුරාම සාර්‍ථකවේයයි හඟිමු.

තවද කෂාය ද්‍රව්‍ය සැපයීමෙහිදී සාමාන්‍යයෙන් දැනගතයුතු කරුණුද කෂාය සිඳුවා ගැනීමෙහි උපචාර පටිපාටිය හා ප්‍රතිවාප යෙදියයුතු ක්‍රමයද, සපයාගැනීමට දුෂ්කරවූ ද්‍රව්‍යයන්ගේ අභාව යෙහි ගතයුතුඑම ද්‍රව්‍යයන් සැකෙවින් දැක්වීමද, එක්වගයෙහි සිට සියක්වගය දක්වා කලන් දෙලොස ඌනාධික නොව කිරාගැනීමේ ශාස්ත්‍රයුක්තියද මෙහි අන්තර්ගතවතිබේ. මෙහිඅපගේ ප්‍රමාද භ්‍රමාදීන් ජනිත දෙස් ඇතද, ඒ ග්‍රන්‍ථ සම්පාදනය පිළිබඳ දුෂ්කරත්වය දත් සුධීන්ගේ සමාධියට භාජනවේවායනු අපගේ බලාපොරොත්තුවයි

මෙය මතු මුද්‍රණය කරවන වර ශුද්ධි පත්‍රයක් හා තවත් අෂ්ට මාංශාවශෙෂිත කෂාය යොගයන්ද ඇතුළත් කරන බවත් පොත පිළිබඳ සියලු අයිතිය අප වෙතම තබාගත් බවත් මෙයින් සියලු දෙනා විසින් දැනගතයුතුයි.

සියළු සත්ත්වයෝ නිදුක් නීරෝගී සුවපත් වෙත්වා!!

මේවගට,

ගොඩමුණේ ශ්‍රී දෙවමිත්‍රාස්ථවිරයෙමි.

20–10–27.

ශ්‍රී දෙවප්‍රියාරාම විහාරස්ථානයේදීය.

පුම්ගල (නැපෑල්)

කෂාය ද්‍රව්‍ය සපයාගැනීමෙහිදී

සාමාන්‍යයෙන් දැනගතයුතු කරුණු නම්.

ඖෂධ ග්‍රහණයෝග්‍ය භූමිඃ ඔසුගන්ට සුදුසු බිම්.

———)×(———

1 තත්‍රසාධාරණෙදෙශෙධන්‍යෙ වාලක්ෂණාන්විතෙ
ජ්‍යොත්ස්නා තපානිලජලෛර්‍යථාකාලං නිෂෙවිතෙ

ධන්‍යෙ, පවිත්‍රවූ; ලක්ෂණාන්විතෙවා, කියනලද ලක්ෂණයන් ගෙන් යුක්තවූහෝ, ජ්‍යොත්ස්නා ආතපඅනිලජලෛඃ, සඳරැස් අවු සුළං ජල යන මොවුන් විසින්; යථාකාලං, කල්වූ පරිද්දෙන්; නිෂෙවිතෙ, සෙවුනාලදුවූ, තත්‍රසාධාරණදෙශෙ, ඒ සාධාරණ දෙශයෙහි;

2 ප්‍රදක්ෂිණොදකාමෘවී ප්‍රභූතාකෘශ රෞහිෂා
ස්නිග්ධාකෘෂ්ණාසුවර්ණාභා සුරභිස්වාදු මෘත්තිකා

ප්‍රදක්ෂිණොදකා, භාත්පසින් ගියාවූ ජලයඇති; මෘවී, මෘදුවූ, ප්‍රභූත, බොහෝවූ; අකෘශ සිහින්නොවූ; රෞහිෂා මුවන් හෝ ඉසුන් ඇතනාවූ; ස්නිග්ධා, සිනිදුවූ; අකෘෂ්ණ, කලුනුවූ; සුවර්ණාභා රන්වන්වූ; සුරභි, සුගඳවූ; ස්වාදුමෘත්තිකා, මිහිරිමැටිඇති;

3 ශර්කරොෂරපාෂාණශ්වභ්‍රවල්මීකවර්ජිතා
චෛත්‍යශ්මශානායතන- විඩිභ්‍යාධ්‍යානා දනන්විතා

ශර්කරා, කැටිකැබිලිතිද; ඌෂර, කරමැටිද; පාෂාණ, ගල්ද; ශ්වභ්‍ර, හෙප්වල්ද; වල්මීක, තුඹස්ද යන මෙයින්; වර්ජිතා, තොරවූ; චෛත්‍ය, චෛත්‍යස්ථානද; ශ්මශාන, සොහොන්ද; ආයතන, බුද්ධාදීන් වඩිනුලබන ස්ථාන හෝ යාගස්ථානද; විඩහ්‍යඃ, වඩිඃස්ථානද යන මොවුන්කෙරෙන්හා; ධ්‍යානාත්, තපස්වීන්ගේ ධ්‍යානමණ්ඩලවලින්ද; අනන්විතා, යුක්තනොවූ;

4 කපාලකාතී නාක්‍රාන්තා තුහෙශ්චබලවත්තරෛඃ
ශුචිස්සමාසාද්භෛෂජ්‍ය ග්‍රහණෙ භූමිරිෂ්‍යතෙ

බලවත්තරෛඃ, අතිශයින් බලවත්වූ; තුහෙශ්ච, ව්‍යාඝ්‍රයන් විසින්ද; "ච" සබ්දයෙන් අන්‍යශිව්පාවුන් විසින්ද; අනාක්‍රාන්තා, නොමඩනාලද්දාවූ; ශුචිඃ, පිරිසිදුවූ; භූමිඃ, භූමිතොමෝ; කපාලකාතී, උදලු ආදී යම්කිසිකපාලයකින් (ලිහිල්ව) කපනලද්දී; භෛෂජ්‍යග්‍රහණෙ, බෙහෙත්ගැන්මෙහි; සමාසාත්, සංක්ෂෙප යෙන්, ඉෂ්‍යතෙ, කැමතිවනුලැබේ;